කො/දේවි බාලිකා විද්‍යාලය - කොළඹ

පළමු වාර පරීක්ෂණය - 2016 (මාර්තු)

## උඩරට නර්තනය - I

7 ශ්‍රේණිය

කාලය පැය $1^{1/2}$ යි

- නිවැරදි පිළිතුර තෝරන්න.

01. නර්තනයේ මූලික ඉරියව්ව වන්නේ,
    i. පාසරඹ
    ii. ගොඩසරඹ
    iii. මැන්ඩිය
    iv. නමස්කාරය

02. තුරඟා වන්නමේ බෙරපදය වන්නේ
    i. දොම්කිට කිට දොම්
    ii. දොදොංත තකු දොම්
    iii. ජිං ජිං ගත කුදගතදොම්
    iv. දොංජිත ගත දොංත

03. උඩරට නර්තන ශිල්පියෙකු ආධුනික කල උගත යුතු ගොඩසරඹ සංඛ්‍යාව වන්නේ
    i. දහ හතරයි
    ii. දොලහයි
    iii. පහළොවයි
    iv. විස්සයි

04. කස්තිරමක් යන්න ආධුනිකයකු මුලින්ම හඳුනාගන්නේ
    i. පා සරඹ නැටීමෙන්ය
    ii. ගැමි නැටුම් නැටීමේදීය
    iii. ගොඩසරඹ නැටීමේදීය
    iv. වන්නම් නැටීමේදීය

05. තාලයට වඩා රිද්මය මුල්කරගෙන ගායනා කරන්නේ
    i. තාලම් කවිය
    ii. ගොයම් කවිය
    iii. වන්නමිය
    iv. ඔන්චිලිවාරමිය

06. මැදුම් තනි තිතට අයත් මාත්‍රා සංඛ්‍යාව වන්නේ
    i. 2 කි
    ii. 3 කි
    iii. 4 කි
    iv. 5 කි

07. උඩරට නර්තනය වැඩිවශයෙන් දැකිය හැකි ප්‍රධාන පෙරහැර පවත්වන්නේ
    i. මාතර
    ii. මහනුවර
    iii. කොළඹ
    iv. රත්නපුර

08. විකල්ප වාද්‍ය භාණ්ඩ පමණක් ඇති වර්ගය වන්නේ
    i. ගැටබෙරය, යක් බෙරය, දවුල
    ii. ටින් බෙරය, ගැට බෙරය, එක්ස්රේ රබාන
    iii. තාලම්පට, ඩොල්කිය, ටින් පියන් තාලම්පට
    iv. පන්තේරුව, මද්දලය, තම්මැට්ටම

43

09. ශ්‍රව්‍ය දෘශ්‍ය ජනමාධ්‍යයක් වන්නේ

i. පුවත් පත
ii. ගුවන් විදුලිය
iii. සඟරා
iv. රූපවාහිනිය

10. තිත් තෙයි යන ධ්වනි දෙක උපදින්නේ

i. පන්තේරුවෙහි
ii. ටොනික්පියන් පන්තේරුවෙහි
iii. දවුබෙරයයි
iv. තාලම්පටෙයි

- පහත සඳහන් වගන්තිවල හිස්තැන් පුරවන්න.

11. "සාර සදිසි පෙති පේර නෙලනකල" යනු ............................................ කවියකි.
12. රත්නපුර ප්‍රදේශයේ ප්‍රචලිත නර්තන සම්ප්‍රදාය ............................................ නර්තනයයි.
13. ගැමිනැටුම් නිර්මානය කිරීමේදී ............................................ යොදාගැනෙන නර්තනය කළයුතුය.
14. ජාතික ගීය නිර්මානය කරන ලද්දේ ............................................ මහතා විසිනි.
15. පඩුවස් දෙව්රජුට ............................................ නැමැති දෝෂය වැළඳුනි.

- හරිනම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද පහත වගන්ති ඉදිරියෙන් යොදන්න.

16. පිම්බීම සංචාරී චලනයයි. ( )
17. සුළුතනි තිතට මාත්‍රා 4 ක් අයත්වේ. ( )
18. පහන් මඩු ශාන්තිකර්මය සබරගමු නර්තන සම්ප්‍රදායට අයත්වේ. ( )
19. ප්‍රස්ථාර කරනයේදී ^ / යන සංකේත යොදාගනී. ( )
20. තුං තුඹ ගෙඩි තුනයි තුනයි මෙය බෙරපදයකි. ( )

## 2 - කොටස

- පහත සඳහන් ප්‍රශ්න අතුරින් ඔබ කැමති ප්‍රශ්න 3 කට පිළිතුරු ලියන්න.

01) බෙරපපද. කවි ගනිතමය ගොනුකර ගැනීම ප්‍රස්ථාරනයේදී සිදුවේ.

i. මාත්‍රා 2 තනිතිතට අයත් බෙර පදයක් ලියන්න.

ii. මාත්‍රා 2 තනි තිතට අයත් කවියක් ප්‍රස්ථාර කරන්න.

02) දේශීය නර්තන සම්ප්‍රදායන් 3 කට අයත් තොරතුරු පහත කරුණු අනුව සටහන් කරන්න.

i. නර්තන සම්ප්‍රදායන් තුන නම් කරන්න

ii. එම ත්‍රිත්වය ප්‍රභවයලත් ප්‍රදේශ නම් කරන්න

iii. ප්‍රධාන වාද්‍ය භාණ්ඩ නම් කරන්න

iv. එක් එක් සම්ප්‍රදායන්ට අයත් ඔබ දන්නා ශාන්තිකර්ම ලියන්න.

03)

i. ගැමිනැටුම් 5 ක් නම් කරන්න.

ii. ඒ සඳහා එක් නර්තනයකට කවියක් ලියන්න.

iii. රංග රටා 2 ක් ඇඳපෙන්වන්න.

04) සබරගමු සමන් දේවාලයේ පවත්වනු ලබන දේවාල පෙරහැර පිළිබඳ පහත සඳහන් මාතෘකා පිළිබඳ තොරතුරු ලියන්න.

i. දේවාලයේ විදි 5 ලියන්න.

ii. චාරිත්‍රවිදි 3 ක් ලියන්න

iii. පෙරහැර පෙරහැර පකින් යුක්තවේ. ඒවා නම් කරන්න.

The National e-learning Portal for The General Education

45